**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**නිවාඩු කාලීන පැවරුම්**

**සිංහල - 9 ශ්‍රේණිය**

**නිවිතිගල අධ්‍යාපන කලාපය**

ජනවාරි 2 සතිය

## 1 පාඩම - ශ්‍රී පාදය වැන්දවූ හැටි

❖ පාඩම හොඳින් කියවන්න.

1. පිළිතුරු සපයන්න.

❋ ජනශ්‍රැතියට අදාළ අංග නම් කරන්න.

❋ "මග දිගට ජනකතා" කෘතියෙහි ඇති තවත් කතාවක් සොයා ලියන්න.

❋ ශ්‍රී පාදය වැන්දවූ හැටි ජනකතාවේ සිද්ධි අනුපිළිවෙළින් ලියන්න.

❋ කතාවේ සඳහන් බාල පුතු සතු ගුණාංග ලැයිස්තුවක් සකසන්න.

❋ බාල පුතු තැනවූ ශ්‍රී පාදය චිත්‍රයට නගන්න.

2. මෙම ප්‍රකාශවල හරි වැරදි බව වරහන් තුළ යොදන්න.

❋ සිටු මාතාව හා බාල පුතු පමණක් ශ්‍රී පාද වන්දනාවේ ගියහ. (......)

❋ බාල පුතු සිය මව රැගෙන ගියේ සැබෑ ශ්‍රී පාදය වැඳීමට ය. (......)

❋ යම් පුතෙක් තමාගේ අදහස ඉෂ්ට කළහොත් මුළු වස්තුවම පවරා දෙන බවට සිටු මව පොරොන්දු විය. (......)

❋ අම්මාගේ තත්ත්වයේ හැටියට ශ්‍රී පාදය වන්දනා කිරීම කිසිසේත්ම කළ නොහැකි බව පුත්තු තිදෙනා ම ප්‍රකාශ කළහ. (......)

❋ ශ්‍රී පාද වන්දනාවෙන් පසු තමන් සතු සියලු වස්තුව සිටු මාතාව විසින් බාල පුතුට පැවරිණි. (......)

3. පහත සඳහන් වචන සඳහා පාඩමේ යෙදී ඇති වචන ලියන්න.

🕮 නෙළුම

🕮 මරණය

🕮 දක්ෂිණ

🕮 රාශිය

🕮 අමාරු

4. වගුව සම්පූර්ණ කරන්න.

| අනු අංකය | ප්‍රකාශය | කීවේ කවුද? |
|---|---|---|
| 01. | මම ඔබ ශ්‍රී පාදයට කැඳවාගෙන යමි.. | |
| 02. | දරුවෙනි මම ලංකාවේ බොහෝ වෙහෙර විහාර වන්දනා කළෙමි..එබැවින් එය වහා අස් කරගනු මැනවි.. | |

5. “මම ගුණගරුක දරුවෙක් වෙමි” යන මාතෘකාවට රචනාවක් ලියන්න.